දුරකථන:
தொலைபேசி
Telephone:

සභාපති / தலைவர் / Chairman: (+94) 011 2556840

ලේකම් / செயலாளர்: / Secretary: (+94) 011 2556831

කාර්යාලය / காரியாலயம் / Office: (+94) 0112556834
0113071324

ෆැක්ස්: / தொ.நகல / Fax: ( +94) 011 2556836
011 2556837

විද්‍යුත් තැපැල / மின்னஞ்சல்: / e-mail: fincom@sltnet.lk

# මුදල් කොමිෂන්සභාව

( ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154'ජ' ව්‍යවස්ථාව යටතේපිහිටුවන ලදී.)

# நிதிஆணைக்குழு

(அரசியலமைப்பின் 154`எ ஆம்உறுப்புரையின்கீழ் தாபிக்கப்பட்டது)

# FINANCE COMMISSION

(Established under Article 154 R of the Constitution)

48, වජිර පාර,
කොළඹ 04.

48, வஜிராவீதி,
கொழும்பு-04, இலங்கை.

48, Vajira Road,
Colombo 04, Sri Lanka.

මගේ අංකය / எனது இல: / My No: FC/3/2/2017-i

ඔබේ අංකය / உமது இல: / Your No:

දිනය / திகதி: / Date: 2016.12.05

ප්‍රධාන ලේකම්

බස්නාහිර,මධ්‍යම,දකුණ,උතුර,වයඹ,උතුරුමැද,ඌව,සබරගමුව සහ නැගෙනහිර පළාත

හිතවත් ප්‍රධාන ලේකම්තුමනි/තුමියනි,

**<u>පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ 2017</u>**

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ 2017 වර්ෂය සඳහා වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී පහත දැක්වෙන කරුණු පිළිබඳව නිසි අවධානය යොමු කරන ලෙස ඔබගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

### 01.රජයේ සංවර්ධන ප්‍රතිපත්තිය

සම්මුතිවාදි ජාතික රජයේ දැක්ම වනුයේ වසර 2020 වනවිට ඉහළ මැදි ආදායම් සහිත ආර්ථික තත්ත්වයක් කරා ලඟා වීමයි. එම අරමුණ සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් රජය විසින් සමාජ සාධාරණත්ව ප්‍රවර්ධනය හා ඉහල වර්ධනය යන ද්විත්ව අරමුණු හා බැඳුණු සමාජීය වෙළඳපොල සංකල්පය මත පදනම් වූ උපාය මාර්ග අනුගමනය කරනු ලැබේ.

මෙකී සන්දර්භය තුළ මධ්‍ය කාලීන සාර්ව ආර්ථික අරමුණු සාක්ෂාත් කරගැනීම පෙරදැරිව පහත දැක්වෙන ක්ෂේත්‍ර පහ කෙරෙහි ප්‍රමුඛතාව ලබාදීමට කටයුතු කෙරෙනු ඇත.

- රැකියා දශ ලක්ෂයක් උත්පාදනය කිරීම.
- ජනතාවගේ ආදායම් මට්ටම් ඉහළ නැංවීම.
- ග්‍රාමීය ආර්ථිකයන් සංවර්ධනය කරලීම.
- ග්‍රාමීය හා වතු අංශ විශේෂිතව ඉඩම් හිමිකාරිත්වය තහවුරු කිරීම.
- පුළුල් සහ ශක්තිමත් මධ්‍යම පන්තියක් නිර්මාණය කිරීම.

මෙම තත්ත්වය තුළ ජාතික සංවර්ධනය උදෙසා පළාත් දායකත්වය පහත දැක්වෙන අයුරින් අපේක්ෂා කෙරේ.

- ගෝලීය වෙළඳ පොළ සමඟ එක්ව කටයුතු කිරීමට විශාල හා කුඩා පරිමාණ ගොවීන් හා ව්‍යවසායකයින් දිරි ගැන්වීම.
- පළාත් මට්ටමින් ආහාර සුරක්ෂිතභාවය තහවුරු කිරීම.
- ගොවීන්ගේ තීරණාත්මක ගැටළු කෙරෙහි අවධානය යොමු කිරීම සහ ග්‍රාමීය ආර්ථිකය සංවර්ධනය කිරීම.
- ග්‍රාමීය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
- රැකියා දශලක්ෂයක් උත්පාදනය කිරීමේ ජාතික වැඩසටහන සඳහා දායක වීම.
- ව්‍යවසායකයන්ගේ කුසලතා වැඩිදියුණු කිරීම තුලින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය කරලීම.
- අවශ්‍ය සේවා හා පහසුකම් සැපයීම මගින් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කරලීම.
- රටතුළ මානව සම්පත වැඩිදියුණු කිරීම උදෙසා අධ්‍යාපන හා සෞඛ්‍ය අංශවල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- දිළිඳු පවුල් ඉලක්ක කර දරිද්‍රතාව දුරලීමේ වැඩ සටහන් ක්‍රියාවට නැංවීම.

**02.ජනාධිපති ලේකම් කාර්යාලය මගින් සම්බන්ධීකරණය කරනු ලබන ජාතික වැඩසටහන්**

ජනාධිපති ලේකම් කාර්යාලය මගින් සම්බන්ධීකරණය කරනු ලබන ජාතික වැඩසටහන් තුලින් අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර ගැනීම උදෙසා ඵලදායී දායකත්වයක් ලැබෙන පරිදි පළාත් විසින් ස්වකීය සංවර්ධන සැලසුම් සකස් කළ යුතුය.

- ආහාර නිෂ්පාදනජාතික වැඩසටහන
- පරිසර කළමනාකරණජාතික වැඩසටහන (හරිත සංවර්ධනය)
- මත්ද්‍රව්‍ය නිවාරණජාතික වැඩසටහන
- වකුගඩු රෝග නිවාරණජාතික වැඩසටහන

**03.තිරසාර සංවර්ධන අරමුණු**

ශ්‍රී ලංකාව, එක්සත් ජාතීන්ගේ 70වන මහ සමුළුවේදී ප්‍රකාශයට පත් කරන ලද තිරසාර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම උදෙසා අත්සන් තබන ලද රටවල් අතුරින් එකකි. තිරසාර සංවර්ධන අරමුණු සංඛ්‍යාව 17 ක් වන අතර ඒ හා සම්බන්ධිත ඉලක්ක සංඛ්‍යාව 169 කි. පළාත් සංවර්ධනයට අදාළ තිරසාර සංවර්ධන අරමුණු පහත පරිදි වේ.

- වසර 2030 වන විට සියළුම ආකාරයේ දරිද්‍රතාව තුරන් කිරීම.
- වසර 2030 වන විට සියළුම ආකාරයේ කුසගින්න හා මන්ද පෝෂණය තුරන් කිරීම.
- වසර 2030 වන විට ඒඩ්ස් රෝගය, ක්ෂය රෝගය, මැලේරියාව හා අනෙකුත් වසංගත රෝග තුරන් කරමින් සෞඛ්‍ය හා යහපැවැත්ම සහතික කිරීම.
- වසර 2030 වන විට සියළුම ගැහැණු හා පිරිමි ළමුන් නිදහස්, ප්‍රාථමික හා ද්විතීයික පාසැල් අධ්‍යාපනය සම්පූර්ණ කරන බවට තහවුරු කිරීම.
- වසර 2030 වන විට සුරක්ෂිත පානීය ජලය ලබා ගැනීමට අදාල විශ්ව ප්‍රවේශය තහවුරු කිරීම.
- වසර 2030 වන විට දැරිය හැකි විදුලිය සඳහා විශ්ව ප්‍රවේශය තහවුරු කිරීම.
- අවම ආදායම් කාණ්ඩවලට අයත් ආදායම් උපයන්නන් බලගැන්වීම උදෙසා ප්‍රතිපත්ති සම්පාදනය හා ජනවර්ගය, ස්ත්‍රී පුරුෂ භාවය වැනි කරුණු නොලසකා සමාජයේ සියළු දෙනාම ඇතුළත් වන පරිදි ආදායම් ප්‍රවර්ධනය සහතික කරලීම.
- වසර 2030 වන විට වනාන්තර, තෙත්බිම්, වියළි ඉඩම් සහ කඳු යන භෞමික පරිසර පද්ධතීන් කඩිනමින් සංරක්ෂණය හා ස්ථාපනය කිරීම.
- සියල්ලන් සඳහා යුක්තිය හිමිකර ගැනීමට ඇති හැකියාව තහවුරු කිරීම, සියළු මට්ටමින් ඵලදායී, වගවීමෙන් යුතු ආයතන ගොඩනැගීම සහ සියළුදෙනා හට සාමකාමී සමාජයක් ප්‍රවර්ධනය කිරීමමත තිරසාර සංවර්ධනයක් සඳහා කැපවීම.

**අයවැය කථාව -2017 තුළ ඇතුළත් විශේෂිත කරුණු**

**(අ.) පොදු ලක්ෂණ**

i. 2017 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අයවැයෙහි පුළුල් තේමාව වනුයේ "පුළුල් සමාජ පදනමකින් යුත් කඩිනම් සංවර්ධනය"යන්නයි.

ii. 2017 වර්ෂය දිළිඳුකම පිටුදැකිමේ වර්ෂය ලෙස ප්‍රකාශයට පත්කිරීමේ තීරණයට අනුකූලව යමින් දිළිඳු හිතවාදී ප්‍රතිපත්තීන් ක්‍රියාවට නැංවීම පහසු කරලීම.

iii. හරිත හා නව සොයාගැනීම් මත පදනම් වූ ආර්ථිකයක් ගොඩනැගීම පිළිබඳ ජාතික සංවර්ධන උපායමාර්ග සමඟ අනුගත වීම.

iv. යටිතල පහසුකම් සහ නීතිමය හා ආයතනික සහය සැපයීම මගින් "වෘද්ධි යාන්ත්‍රණය" සේ සැලකෙන පෞද්ගලික අංශය පෝෂණය කිරීම සහ දිරිමත් කිරීම.

v. ඩිජිටල් ආර්ථිකය, සංචාරක ව්‍යාපාරය, වාණිජමය කෘෂිකර්මය සහ කාර්මීකරණය යන ක්ෂේත්‍ර තුල රාජ්‍ය හා පෞද්ගලික ආයෝජනය දිරිමත් කිරීම හා කේන්ද්‍රගත කිරීම ප්‍රවර්ධනය කරලීම හා ඒ පිළිබඳ විශේෂ අවධානය යොමු කිරීම සම්බන්ධව ප්‍රවර්ධනය සහ අවධානය.

**(ආ.) ආංශික ප්‍රමුඛතා**

**(i) කෘෂි කර්මාන්තය**

- අඩු අස්වැන්න,අඩු ආදායම සහ භෝග කීපයක් මත රඳා පැවතීම යන කරුණු මත පදනම් වූ කෘෂි කර්මය, වාණිජමය, ඉහළ ආදායම් ලබන සහ අපනයන මුල් කරගත් අංශයක් බවට පරිවර්තනය කිරීම.
- ගොවීන්ගේ කේවල් ශක්තිය වැඩි කරමින් ඔවුන් බල ගැන්වීම සඳහා ගොවි සමුපකාර සමිති පිහිටුවීම.
- අගය එකතු කිරීමේ දාමයටපහසුකම් සැලසීම සඳහා "කුඩා නිෂ්පාදකයා සහ මහා ගැනුම්කරු" යන සංකල්පය මත පදනම්ව "බාහිර වගාකරුවන්ගේ ආදර්ශය" ක්‍රියාවට නැංවීමට උනන්දු කරවීම.
- අර්තාපල්, ලොකු ළූණු,මිරිස්,බඩ ඉරිඟු සහ සෝයා යන ප්‍රධාන ආහාර බෝග 05 න් ස්වයංපෝෂිත වීම යන පදනම මත පිහිටා ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන ක්‍රියාවට නැංවීම.
- අධි තාක්ෂණික වාරිමාර්ග ක්‍රම සහ ඵලදායීතාවය ඉහළ නැංවීමේ කෘෂි තාක්ෂණය භාවිතයටගැනීම ප්‍රවර්ධන කිරීම.
- අදාල යන්ත්‍රසූත්‍ර ආනයනයේදී අය කරනු ලබන තීරු බදු සහ අනෙකුත් බදු වර්ග අඩු කිරීම තුළින් ගොවිබිම් යාන්ත්‍රිකරණය කිරීමේ වැඩපිළිවෙල දිරිගැන්වීම.

**(ii) පශු සම්පත් අංශය**

- ව්‍යවසායක ශක්තියක් සහිත ස්වයංරැකියා පදනමින් ක්‍රියා කරන පශු ගොවීන් සඳහා ඉහළ කිරි නිෂ්පාදනයක් ලබා දෙන එළදෙනුන් සැපයීම.
- රාජ්‍ය- පෞද්ගලික හවුල්කාරිත්ව ප්‍රවේශය භාවිත කරමින් තෝරාගත් දිස්ත්‍රික්ක වල පශු සංවර්ධන කලාප පිහිටුවීම.
- සහනදායි පොලී අනුපාත යටතේ පශු ගොවීන්ට ණය පහසුකම් සැපයීම මගින් අරමුදල් පිළිබඳව පවත්නා පරතරය පියවීමට උපකාරී වීම.

**(iii) මිරිදිය ධීවර කර්මාන්තය**

- මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා “ඒකාබද්ධ මිරිදිය ධීවර කර්මාන්ත ගම්මාන” ස්ථාපිත කිරීම.
- ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ (NAQDA) සහය ඇතිව වාණිජමය පදනමින් මිරිදිය මත්ස්‍ය කර්මාන්තය දියුණු කිරීම සඳහා තාක්ෂණික සහය ලබාදීම.

- වැඩි ඵලදාවක් ලබා දෙන "බාහිර වගාකරුවන්ගේ ආදර්ශය" භාවිතයෙන් විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම.

## (iv) අධ්‍යාපනය

- යටිතල පහසුකම් සංවර්ධනය, ගුරුපුහුණුව, විෂය නිර්දේශ සංවර්ධනය හා විද්‍යාව හා තාක්ෂණය මත පදනම් වු අධ්‍යාපනය සඳහා අරමුදල් සැපයීම පිළිබඳ වැඩි අවධානයක් දැක්වීම.
- ග්‍රාමීය ප්‍රදේශවල පාසල් සඳහා පන්ති කාමර,විද්‍යාගාර උපකරණ සහ ගෘහ භාණ්ඩ සැපයීම පිණිස අවශ්‍ය අරමුදල් ලබා දීම.
- පරිගණක සහ ටැබ් පරිගණක වැනි නවීන ඉගැනුම් උපකරණවලින් සමන්විත "දැකුම්කළු පන්ති කාමර "සංකල්පය හඳුන්වා දීම මගින් පාසල් ළමුන් තුළ සිත් ඇදගන්නා සුළු වාතාවරණයක් නිර්මාණය කිරීම.
- වතු කම්කරුවන්ගේ දරුවන් සඳහා ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කරලීම පිණිස අවශ්‍ය පහසුකම් ලබාදීම තුළින් වතු පාසල් නගා සිටුවීම.
- ආබාධිත දරුවන්ට උපකාර කිරීම සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය මත පදනම් වු ද්‍රව්‍ය භාවිතයට ගනිමින් විශේෂ හා විධිමත් නොවන අධ්‍යාපන වැඩසටහන් තවදුරටත් වැඩි දියුණු කිරීම.
- මුළු රටම ආවරණය වන පරිදි අවුරුදු 5-19ත් අතර වයස් වල පාසල් ළමුන් සඳහා රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම.

## (V) සෞඛ්‍ය

- ප්‍රධාන වශයෙන් වාට්ටු,ශල්‍යාගාර,රසායනාගාර සහ උපකරණ ඇතුළු රෝහල්වල භෞතික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
- බෝ නොවන රෝග සීග්‍රයෙන් පැතිරීම වැලැක්වීම සම්බන්ධයෙන් සෞඛ්‍ය බලධාරින් විසින් පාසල් දරුවන් දැනුවත් කිරීම.
- සීඝ්‍රයෙන් පැතිර යන වකුගඩු රෝගය සහ අනෙකුත් බෝනොවන රෝග (NCD) සම්බන්ධයෙන් පර්යේෂණ කටයුතු සඳහා පහසුකම් සැලසීම.
- ළමා මරණ අඩුකිරීම සඳහා තෝරාගත් රෝහල්වල විශේෂිත ළමා රෝග සඳහා ප්‍රතිකාර කිරීමට වාට්ටු සංකීර්ණ ස්ථාපිත කිරීම.
- ටෙලි - වෛද්‍ය (Tele - Medicine) වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම මගින් සෞඛ්‍ය සේවා පද්ධතිය තුළ තොරතුරු තාක්ෂණය භාවිතයට ගැනීම ප්‍රචලිතකරලීම.

- රටපුරා සෞඛ්‍ය සහ පෝෂණය පිළිබඳ ශ්‍රමිකයින්ගේ හිඟයක් පවතින බැවින් එවැනි තනතුරුවල සංඛ්‍යාව වැඩි කිරීම.
- රජයේ රෝහල්වල පෞද්ගලික වෛද්‍ය පරීක්ෂණ රසායනාගාර පිහිටුවීම.
- ආයුර්වේද වෛද්‍ය විද්‍යාවට අදාලව පර්යේෂණ හා සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීම.

**(vi) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය**

- රජය විසින් මූලික ප්‍රාග්ධනය සැපයීම මගින් සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් සඳහා ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය ශක්තිමත් කිරීම.
- රජය විසින් 50% ක පොලී සහනාධාරයක් ලබා දීම මගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට සහණදායී ණය පහසුකම් සැපයීම.
- ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ (IDB) සහය ඇතිව අවශ්‍ය යටිතල පහසුකම් හා පුහුණුව ලබාදීම තුලින් රෙදිපිළි සහ අත්යන්ත්‍ර පේෂකර්මාන්තය නගා සිටුවීම.
- දැඩි මුදල් ප්‍රවාහ ගැටළුවලට මුහුණ දී සිටින දේශීය කර්මාන්ත කරුවන් සඳහා වෙළෙඳපොළ පහසුකම් වැඩිදියුණු කිරීම.

**(vii) සංචාරක කර්මාන්තය**

- අවශ්‍ය යටිතල පහසුකම් සහ ශක්තිමත් නියාමන රාමුවක් සැපයීම මගින් සංචාරක කර්මාන්තයේ ආයෝජනය කිරීමට පෞද්ගලික අංශය යොමුකර වීම.
- හෝටල්වල පහසුකම් වැඩිකිරීම සඳහා පොලී සහන සහිත ණය ලබාදීම තුලින් හෝටල් හිමියන්ට උපකාර කිරීම.
- සංචාරක සංවර්ධන අරමුදල උපයෝගී කරගනිමින් සංචාරක ආකර්ෂණීය ස්ථානවල සංස්කෘතික සංදර්ශන සංවිධානය කිරීම.
- සංචාරක කර්මාන්තය තුළ දේශීය නිෂ්පාදන භාවිතය ධෛර්යමත් කිරීම සඳහා දේශිය වශයෙන් අගය එකතුකිරිමේ දාම (Value Chains) ඇති කිරිම.
- තෝරාගත් දිස්ත්‍රික්කවල පෞද්ගලික හා රාජ්‍ය හවුල්කාරිත්ව පදනම යටතේ සංචාරක ක්ෂේත්‍රයේ රැස්වීම්, දිරි ගැන්වීම්, සම්මන්ත්‍රණ හා ප්‍රදර්ශන යන කාර්යයන් ආවරණය වන පරිදි මධ්‍යස්ථාන පිහිටු වීම.(MICE exhibition centers)
- දේශීය හස්ත කර්මාන්ත නිෂ්පාදන ප්‍රදර්ශනය හා අලෙවිය සඳහා නැගෙනහිර වෙරළ තීරයෙහි පුහුණු මධ්‍යස්ථාන හා තොරතුරු මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.

**(Viii) ග්‍රාමීය සංවර්ධනය (ගමෙන් රට හදමු)**

- උද්ධමනයට සමානුපාතික වන ලෙස පළාත් පාලන ආයතන වල ආදායම් ඉහළ නැංවීම තුලින් එම ආයතන විසින් සපයනු ලබන සේවාවන් වැඩි දියුණු කිරීම.
- පෞද්ගලික හා රාජ්‍ය අංශ වල හවුල්කාරිත්ව ප්‍රවේශය යටතේ වාණිජමය වශයෙන් සාර්ථකව පවත්වාගෙන යා හැකි කසල කළමනාකරණ යාන්ත්‍රණයන් ඇති කිරීම.
- ග්‍රාමීය ආර්ථික ක්‍රියාකාරකම් වලට හා සමාජ සුභ සාධනයට සානුබල සැපයෙන පරිදි ග්‍රාමීය මාර්ග වැඩිදියුණු කිරීම.
- කුඩා පරිමාණ වැව් නවීකරණය, ප්‍රතිසංස්කරණය හා ඒවායේ රොන්මඩ ඉවත් කිරීම.
- ග්‍රාමීය සනීපාරක්ෂක පහසුකම්, කෘෂි නිෂ්පාදන පදනම් කරගත් කර්මාන්ත හා කෘෂිකාර්මික උපකාරක සේවා වැඩිදියුණු කිරීම.
- ග්‍රාමීය මට්ටමේ ප්‍රජා නායකයින් සවිබල ගැන්වීම සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ විශේෂ අරමුදලක් පිහිටු වීම. මේ යටතේ ග්‍රාමීය සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ණය පහසුකම් සැපයෙනු ඇත.

## 04. ආංශික මාර්ගෝපදේශය

### 4.1 සමාජ යටිතල පහසුකම්

**අධ්‍යාපනය**

ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ඇතිවන අනාගත අභියෝගයන්ට සාර්ථකව මුහුණ දිය හැකි වන පරිදි නව සංවර්ධනය ඉලක්ක කේන්ද්‍ර කරගනිමින් අධ්‍යාපන අංශයේ ආයෝජනයන් සිදුවිය යුතුය. අධ්‍යාපනික යටිතල පහසුකම් වැඩිදියුණු කරන අතරම, අධ්‍යාපනයේ ඉහළ ගුණාත්මකභාවය හා ප්‍රමිතිය තහවුරු කිරීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමත්, අවශ්‍ය අධ්‍යාපනික උපකරණ සපයා දීමත් සිදුකල යුතුය. මෙහිදී, නොදියුණු ග්‍රාමීය ප්‍රදේශ කෙරෙහි ප්‍රමුඛ අවධානය යොමුවිය යුතු වේ.

**බටහිර වෛද්‍ය ක්ෂේත්‍රය**

සෞඛ්‍ය අංශයට අදාල වැඩසටහන් හා ව්‍යාපෘති මගින් සෞඛ්‍ය සේවාවන්හී ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීමත් එමගින් රෝග නිවාරණය කෙරෙහි වැඩි අවධානය යොමු කිරීමත් අත්‍යාවශ්‍ය වේ. සෞඛ්‍ය තත්ත්වය පිළිඹිබු කෙරෙන නිර්ණායක පහල මට්ටමක පවතින ප්‍රදේශවලට විශේෂ අවධානය යොමු කර අවශ්‍ය භෞතික යටිතල පහසුකම් හා උපකරණ ලබාදීමත්, රෝහල්වලට සුදුසුකම් සහිත කාර්යමණ්ඩල ලබාදීමත් සිදු කල යුතුවේ. වසංගත රෝග හා බෝ නොවන රෝග වළක්වාලීමත්, රෝගීන්ට ප්‍රමාණවත් පහසුකම් ලබාදීමත්, යහපත් සෞඛ්‍ය පුරුදු සඳහා ජනතාව යොමු කිරීමත්

මගින් මරණ හා රෝගීවීම් අනුපාතයන් මගින් පෙන්නුම් කරන ප්‍රාදේශීය විෂමතාවයන් අවම කිරීමට පියවර ගත යුතු වේ.

**දේශීය  වෛද්‍ය ක්ෂේත්‍රය**

පාරම්පරික දේශීය වෛද්‍ය අංශය ඵලදායී අයුරින් ජනතාව වෙත සෞඛ්‍ය සේවාවන් සපයන ක්ෂේත්‍රයක් බවට පත්කිරීම සඳහා නව තාක්ෂණය භාවිතා කිරීමට අවශ්‍ය පියවර ගත යුතුවේ. තවද, දේශීය ඖෂධ නිෂ්පාදනය දිරි ගැන්වීම පිණිස සුදුසු ස්ථාන හඳුනාගෙන ඔසු උයන් ස්ථාපිත කිරීම ඉතා වැදගත් වේ.

**ක්‍රීඩා**

මලල ක්‍රීඩකයින් පළාත්, ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් ජයග්‍රහණ කරා ගෙනයාමට අවශ්‍ය සහය ලබාදීමටත්, ක්‍රීඩාවන් මගින් සෞඛ්‍ය සම්පන්න ජීවිත ගොඩනගා ගැනීම සඳහා ජනතාවට අවශ්‍ය පහසුකම් සැපයීමටත් ප්‍රමුඛතාවය දිය යුතුය. තවද, විනෝදාත්මක වැඩසටහන් සඳහා වැඩි අවධානයක් ලබාදීම මගින් බෝ නොවන රෝග වළක්වා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීමද ඉතා වැදගත් වේ.

**පරිවාස හා ළමාරක්ෂක කටයුතු**

සමාජයෙන් හුදකලා වූ ළමුන් ආයතන ගතකර, සමාජය සමග සම්බන්ධ කිරීම තුලින් හොඳ පුරවැසියන් බිහිකිරීම සඳහා වන පුනරුත්ථාපන කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන්කල යුතු වේ. විශේෂයෙන්ම පරිවාස භාරයේ පසුවන ළමුන්ගේ දෛනික අවශ්‍යතා හා සුභ සාධනය මෙන්ම හිමිකම් හා ආරක්ෂාව සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දැක්විය යුතු වේ. ඔවුන්ගේ ශාරීරික හා මානසික සෞඛ්‍ය සංවර්ධනය, පීඩනයන්ට ගොදුරු වූ දරුවන් සමාජගත කිරීම, ඔවුන්ගේ දැනුම හා කුසලතා වැඩිදියුණු කර දෙමව්පියන්, නෑදැයින් හෝ භාරකරුවන් වෙත භාර දීම ප්‍රමුඛතාවය ලබා දිය යුතු කාර්යයන් වේ.

**සමාජ සේවා**

ඉතා ඉක්මනින් ආපදාවන්ට ලක්විය හැකි අවදානම් සහගත තත්ත්වයේ පසුවන රෝගීන්, වයස්ගත වූවන්, ආබාධිතයින්, ආනාථ වූවන් වැනි අය සඳහා සේවා පහසුකම් සැපයීමට ප්‍රාග්ධන ප්‍රතිපාදන යොදාගත හැකිය. වැඩිහිටි අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට අනුගත වෙමින් හා රටේ පවත්නා නීති රීති හා රෙගුලාසි වලට යටත්ව වැඩිහිටි නිවාස ඇති කිරීමත්, ඒවා නඩත්තු කිරීම මෙන්ම වැඩිහිටියන් රැක බලා ගැනීම සඳහා එම පවුල්වල සාමාජිකයින් දිරිමත් කිරීමේ ක්‍රමෝපායන් හඳුන්වා දීමත් ඉතා වැදගත් වේ. සමාජ ආර්ථික වශයෙන් අවදානම් සහගත පුද්ගලයින් සඳහා ස්වයං රැකියා අවස්ථාවන් උදාකර දී ඔවුන් සමාජීය වශයෙන් ගෞරවාන්විත බවට පත් කිරීම ද මෙහිලා වැදගත් වේ.

**සංස්කෘතික හා ආගමික කටයුතු**

අනාගත පරපුර සඳහා සංස්කෘතිය හා උරුමයන් ආරක්ෂා කර දායාද කර දීමට මෙම අරමුදල් වෙන්කල යුතුය. ස්පෘශ්‍ය හා අස්පෘශ්‍ය සංස්කෘතික වටිනාකම් ඉලක්ක කරමින් මේ යටතේ වැඩසටහන් හා ව්‍යාපෘති හඳුනාගෙන ක්‍රියාත්මක කල හැකි වේ.

**නිවාස**

අඩු ආදායම්ලාභී නිවාස නොමැති පවුල් සඳහා නිවාස ලබා දීමට ප්‍රතිපාදන වෙන් කල යුතු වේ. නිවාස සඳහා ආධාර ලබාදෙන විට එම ප්‍රජාවගේ දායකත්වය ලබා ගැනීමද උනන්දු කල යුතු වේ. නිවාස ණය ලබාදෙන ආයතන වල සහයද ලබාගනිමින් සහනදායී නිවාස ණය පහසුකම් අඩු ආදායම්ලාභී පවුල් සඳහා ලබා දීමට ද කටයුතු කිරීම වැදගත් වේ.

**සමූපකාර ව්‍යාපාර**

සමුපකාර ව්‍යාපාරයේ නියුතු කාර්ය මණ්ඩල හා සාමාජිකයින් සඳහා අත්‍යවශ්‍ය වන පුහුණුවීම් ලබාදීම මගින් සමුපකාර ව්‍යාපාරය සංවර්ධනය කිරීම සඳහා මෙමගින් අරමුදල් වෙන්කර ගත හැකිය. ව්‍යාපාරික කටයුතු වල නිරත සමූපකාර සමිති සඳහා සෘජු ප්‍රදානයන් නොකල යුතු වේ.

## 4.2 ආර්ථික යටිතල පහසුකම්

**පළාත් මාර්ග**

නව මාර්ග ඉදිකිරීම, දැනට පවතින මාර්ග වැඩිදියුණු කිරීම හා මාර්ග පද්ධති නිසි පරිදි නඩත්තු කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබාදිය යුතුය. පළාත් මාර්ග සංවර්ධනයේදී ජාතික මාර්ග පද්ධතිය සමඟ සම්බන්ධතාවය තහවුරු කිරීම තුළින් පළාත් හා ග්‍රාමීය මට්ටමේ නිෂ්පාදකයා හා වෙළෙඳ පොළ අතර සම්බන්ධතාවය ගොඩනැංවීම සිදුකල යුතුය. තවද, කාණු පද්ධතිය හා අනෙකුත් අදාල ව්‍යුහයන් නඩත්තුව පිළිබඳ නිසි අවධානය යොමු කල යුතු වේ.

**වතු යටිතල පහසුකම්**

මෙම අරමුදල්, වතුවල ජීවත් වන ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා අවශ්‍ය සමාජ හා ආර්ථික යටිතල පහසුකම් (උදා:- සනිපාරක්ෂක පහසුකම්,පානීය ජලය, වතු මාර්ග ආදිය) වැඩිදියුණු කිරීමට යොදාගත යුතුය. වතු ජනතාවගේ සමාජ සංවර්ධනය සඳහා වූ ජාතික සැලැස්ම (2016 - 2020) තුල හඳුනාගත් ව්‍යාපෘති සඳහා මෙම අරමුදල් භාවිත කිරීමට යෝජනා කෙරේ.

**ප්‍රවාහනය**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය යටතට අයත් නොවන බස්නැවතුම් පොළවල් ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය සඳහා මෙම අරමුදල් මූලික වශයෙන් යෙදවිය යුතුය. මෙම ක්‍රියාවලිය තුල ජනතාවට අවශ්‍ය මූලික පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය හා ජාතික ගමනාගමන කොමිෂන් සභාව සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගත යුතුය. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, බස් නැවතුම් හා බස් මගී පර්යන්ත වල සාප්පු සංකීර්ණ හා ආපනශාලා වැනි වාණිජමය කටයුතු සඳහා යොදා නොගත යුතුය. එමෙන්ම, බස් නැවතුම් හා මගී පර්යන්ත සඳහා ආදර්ශ සැලසුම් භාවිතා කිරීම යෝග්‍ය වේ.

**ඉඩම්**

මේ යටතේ අරමුදල් යෙදවීමේදී පාරිසරික උවදුරු අවම කිරීම හා ජල මූලාශ්‍ර හා පස සංරක්ෂණය සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතු වේ. මීට අමතරව ආයතනික අරමුණු හා පළාත් මට්ටමින් ඉඩම් නඩත්තු කිරීම වැනි කටයුතු වලදී අවශ්‍ය නීති රීති පැනවීමේ කාර්යයන් සඳහා ද මෙම අරමුදල් භාවිත කළ හැකිය.

**කෘෂිකර්මය**

නිෂ්පාදනය හා ඵලදායීතාවය වැඩිදියුණු කිරීම, සුළු හා මධ්‍ය පරිමාණ වාණිජ මට්ටමේ වගා කටයුතු සඳහා පහසුකම් සැපයීම, කෘෂි කර්මාන්තයට අදාල අගය එකතු කළ කර්මාන්ත ප්‍රවර්ධනය, පුරන් කුඹුරු සඳහා විකල්ප බෝග හඳුන්වා දීම, කෘෂි මාර්ග ඉදිකිරීම හා නඩත්තුව, ප්‍රාදේශීය කෘෂිකාර්මික ගොවිපලවල් හා පුහුණු මධ්‍යස්ථාන නවීකරණය කිරීම වැනි හේතු සඳහා මෙම අරමුදල් යෙදවිය යුතුය. දේශීය හා ගෝලීය ඉල්ලුම සපුරාලීම ඉලක්ක කරගනිමින් නිෂ්පාදන සැපයුම සංවර්ධනය සඳහා විශේෂ අවධානය යොමු කළ යුතුය.

**පශු සම්පත්**

පළාතේ සෞඛ්‍ය සම්පන්න සහ ඵලදායි සත්ව ගහනයක් පවත්වා ගැනීමෙන් මහජනතාව වෙත කිරි, බිත්තර හා මස් සැපයුම වැඩිදියුණු කිරීමට ක්‍රියා කළ යුතුය. මේ සම්බන්ධයෙන් ගත්කළ සත්ව ගොවිපලවල් සඳහා පශු වෛද්‍ය සේවාවන්හි කාර්යක්ෂම සැපයුමක් තහවුරු කිරීම, සුළු හා මධ්‍ය පරිමාණ වාණිජමය ගොවිපලවල් සඳහා පහසුකම් සැපයීම, අගය එකතුකළ කර්මාන්ත ප්‍රවර්ධනය, කිරි එකතු කිරීම හා ගබඩා කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම සහ කෘතිම සිංචනය මගින් දෙමුහුන් සතුන් බිහිකිරීම වැනි කටයුතු සඳහා විශේෂ අවධානය යොමු කළ යුතුය. තවද ආහාර නිෂ්පාදන කර්මාන්තය මෙම ක්ෂේත්‍රය සමඟ සම්බන්ධ විය හැකි ප්‍රධාන අංශ වලින් එකකි.

**මිරිදිය ධීවර**

මේ යටතේ මත්ස්‍ය නිෂ්පාදනය වැඩිකිරීම, අලෙවි පහසුකම් වැඩිදියුණු කිරීම සහ විසිතුරු මත්ස්‍ය වගාව ප්‍රවර්ධනය සඳහා ප්‍රමුඛත්වය ලබාදිය යුතුය. ජාතික ජලජ සම්පත් සංවර්ධන අධිකාරියේ සහය ඇතිව මිරිදිය ධීවරයින් සඳහා අවශ්‍ය තාක්ෂණය ලබාදීමට කටයුතු කළ යුතුය. ධීවර සමිති ශක්තිමත් කර ඔවුන්ගේ කළමනාකරණය වැඩිදියුණු කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගතයුතු වේ. මිරිදිය මසුන් භාවිතා කරමින් අගය එකතු කළ කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු අතර ධීවර ආම්පන්න හා උපකරණ සැපයීම තුළින් ධීවර ප්‍රජාවට පහසුකම් සලසා දිය යුතුය.

**වාරි මාර්ග**

වගා බිම් සඳහා ප්‍රමාණවත් වාරි ජලය ලබාදීම සහතික කිරීමට කටයුතු කළ යුතුය. දැනට පවතින වාරි මාර්ග ව්‍යුහයන් නඩත්තුව, පුනරුත්ථාපනය හා සංවර්ධනය, ක්‍රමානුකූල ජල කළමනාකරණය මෙන්ම ගොවිසංවිධාන වල උපරිම සහභාගිත්වය තහවුරු කර ගැනීම මෙහිදී ඉතා වැදගත් කාර්යයන් වනුඇත. ප්‍රශස්ත ජල කළමනාකරණ ක්‍රියාවලියක් හරහා වී වගාවට අමතරව වෙනත් බෝග වගාවන් සඳහාද වාරි ජලය ලබා දීමට කටයුතු කල යුතුය. කාර්යක්ෂම ජල කළමනාකරණයේ වැදගත්කම පිළිබඳව ගොවීන් දැනුවත් කිරීම සඳහා සුදුසු වැඩසටහන් සංවිධානය කල යුතුය.

**ග්‍රාමීය සංවර්ධනය**

මෙම අරමුදල් ග්‍රාමීය මාර්ග, කුඩා පාලම්, බෝක්කු, ග්‍රාමීය වෙළඳපොළ පහසුකම්, සුසාන භූමි, පුස්තකාල, ප්‍රජා ජල සම්පාදන වැනි ක්ෂේත්‍රවලට අයත් ව්‍යාපෘති සඳහා යෙදවිය යුතුය. මෙම ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කරන අවස්ථාවන්හී ජාතික මට්ටමේ ආයතන සමග වඩාත් හොඳ සම්බන්ධීකරණයක් පවත්වා ගැනීමට අවශ්‍ය වේ. නව තාක්ෂණය හා වෙළඳපොළ පිළිබඳව තොරතුරු සොයා ගැනීම සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය වැනි ආයතන සමඟ සමීපව කටයුතු කිරීම වඩාත් සුදුසු වේ.

**ග්‍රාමීය කර්මාන්ත**

පවත්නා වෙළඳපොළ සම්බන්ධතා තහවුරු කරගනිමින් සහ නව තාක්ෂණය හඳුන්වා දෙමින් සම්ප්‍රදායික හා ගුණාත්මක නිෂ්පාදන දිරිමත් කිරීම සුදුසු වේ. මෙහිදී, වාණිජ මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල, ප්‍රාදේශීය බැංකු, ජාතික ශිල්ප සභාව සහ කාර්මික සංවර්ධන මණ්ඩලය වැනි ආයතන සමග මනා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන පුහුණු වැඩසටහන් අවසානයේදී ජාතික වෘත්තීය සුදුසුකම් රාමුවට (NVQ) අනුගත වන පරිදි සහතික ලබාදීමට කටයුතු කිරීම අවශ්‍ය වේ. වාණිජමය ව්‍යාපාර ආයතන වල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට පෞද්ගලික අංශයේ දායකත්වය ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කල යුතුය.

**ග්‍රාමීය විදුලිබල සැපයුම**

මෙම අරමුදල් භාවිතයට ගෙන ජාතික විදුලිබල පද්ධතියෙන් ග්‍රාමීය ප්‍රදේශවලට විදුලි දිගු සැපයීම හා ජාතික විදුලිබල පද්ධතිය හරහා විදුලි බලය ලබාගත නොහැකි ප්‍රදේශවලට සුදුසු විකල්ප බල ශක්ති ක්‍රම මගින් විදුලිය ලබා ගැනීම සිදුකල හැකිය. ජාතික විදුලිබල පද්ධතියේ සිට විදුලි දිගු ලබාදීමේදී තනි ගෘහ ඒකකයක් සඳහා සම්බන්ධතාවය ලබාදීමට කටයුතු නොකල යුතු අතර පොදු දිගු සැපයීම පමණක් සිදු කල යුතුය.

**සංචාරක**

සංචාරක ආකර්ෂණය වැඩි කිරීම සහ ප්‍රදේශයේ නව රැකියා අවස්ථා උත්පාදනය යන අරමුණු ඉටුකර ගැනීමෙහිලා ශක්‍යතාවක් පවතින ව්‍යාපෘති සඳහා පමණක් අරමුදල් ආයෝජනය කළයුතු වේ. සංචාරක ආකර්ෂණය සහිත ස්ථානවල මූලික සේවා පහසුකම් සැපයීම සිදු කළයුතු අතර,ඒවායේ කළමනාකරණය පෞද්ගලික අංශයට භාරදිය යුතු වේ.(කුඩා ආපනශාලා, සනීපාරක්ෂක පහසුකම්, මුහුද ආශ්‍රිත ස්ථානවල නැවුම් ජලස්නාන පහසුකම් ආදිය) පෞද්ගලික අංශයේ සහභාගීත්වය ලබා ගනිමින් වෙළෙඳපොළ වෙත ප්‍රවේශවීමේ පහසුකම් සැපයීම සඳහා පවත්නා වෙළෙඳ කුටි නවීකරණය කිරීම තුලින් ඉහළ ගුණත්වයකින් යුත් භාණ්ඩ නිපදවීම සඳහා හැකියාවක් සහිත ව්‍යවසායකයන් දිරිමත් කළයුතු ය. එමෙන්ම පළාත් සඳහා විශේෂිත වූ ආකර්ශනීය සංචාරක ස්ථාන පිළිබඳ දේශීය හා විදේශීය සංචාරකයන් දැනුවත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගතයුතු වේ. (එනම් පාරිසරික, ත්‍රාසජනක, කෘෂි, සංස්කෘතික ආදි වශයෙන්)

**පළාත් පාලන**

- **පළාත් පාලන මාර්ග**

    පළාත් පාලන මාර්ග නිසි කලට නඩත්තු කිරීම හා පවත්වාගෙන යාම සඳහා ප්‍රමුඛතාව ලබා දිය යුතු වේ. පළාත් පාලන මාර්ග පද්ධතිය කාර්යක්ෂම හා ස්ථිර පදනමකින් පවත්වාගෙන යාම සඳහා අවස්ථානුකූලව සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් කොන්ක්‍රීට් කිරීම හා තාර ඇතිරීම කළ යුතුය. එම කටයුතු පළාත් පාලන කොමසාරිස්වරයාගේ අධීක්ෂණය යටතේ සිදුවිය යුතුය.

- **ප්‍රජා ජල සැපයීම**

මෙම අරමුදල් යොදවා පානීය ජලය හා සනීපාරක්ෂක පහසුකම් ලබාදීම සිදුකළ යුතුය. පානීය ජලය සැපයීමේදී ජලයේ ගුණාත්මකභාවය ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් තහවුරු කර ගත යුතු වේ. පොදු ළිං හා නාන තටාක සෞඛ්‍යාරක්ෂිතව පවත්වාගෙන යාම හා නඩත්තු කිරීම නිරන්තරයෙන් සිදු කළයුතු වේ.

- **අපද්‍රව්‍ය කළමනාකරණය**

අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය, කොම්පොස්ට් පොහොර නිපදවීම සහ නොදිරන ද්‍රව්‍ය කළමණාකරණය තුලින් අපද්‍රව්‍ය වලට ආර්ථික වටිනාකමක් ලබාදීම වැනි කාර්යයන් සඳහා ප්‍රමුඛත්වය දිය යුතුවේ. කසළ ජනනය කරනු ලබන ස්ථානයන්හීදීම එම කසල වර්ගීකරණය කිරීමට මහජනතාව යොමු කරවීම අත්‍යවශ්‍ය වේ.

- **අනෙකුත් පළාත් පාලන සේවා**

ඉහත උප වැඩසටහන් යටතේ ආවරණය නොවූ වෙනත් සංවර්ධන ක්‍රියාකාරකම් මේ යටතට ඇතුලත් කළ හැකිය.

**පසුගාමී හා හුදෙකලා ගම්මාන සංවර්ධනය**

පළාත් අධිකාරීන් විසින් අවම පහසුකම් සහිත ගම්මාන හඳුනාගත යුතු අතර, ඒකාබද්ධ සංවර්ධන ප්‍රවේශයක් යටතේ එකී ගම්මාන හා නගර සමඟ සම්බන්ධ වීමට හැකිවන පරිදි අවශ්‍ය මූලික පහසුකම් සැපයිය යුතුය. කුඩා පාලම්, ග්‍රාමීය මාර්ග, සෞඛ්‍යාරක්ෂිත පානීය ජලය, හා විදුලිය වැනි මූලික යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම වැනි කරුණු හේතුවෙන් මෙවැනි ගම්මානවල ජීවත්වන ජනතාවට විවිධ දුෂ්කරතාවන්ට මුහුණ පෑමට සිදුවේ. එකී දුෂ්කරතා මගහරවා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමද මේ යටතේ අපේක්ෂා කෙරේ.

**නම්‍යශීලී ප්‍රතිපාදන**

එක් එක් අංශ/ ආයතන සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදනවල ඌණතාවයන් ගලපා ගැනීමට හෝ අනුමත මූලික සැලැස්මට ඇතුළත් නොවූ අත්‍යවශ්‍ය කටයුතු සඳහා යෙදවීමට මෙම ප්‍රතිපාදන භාවිතා කළ යුතුවේ.

**0.5 පොදු මාර්ගෝපදේශ**

(i) සැලසුම් රහිතව සිදුවන ක්‍රියාකාරකම් අවම කිරීම සඳහා ප්‍රධාන අංශ ආවරණයවන පරිදි මූලික සැලැස්මක් (Master Plan) තිබිය යුතුය.

(ii) එක් එක් අංශ පදනම් කරගනිමින් සම්පත් සිතියම්ගත කිරීමේ ක්‍රමවේදය (Resource Mapping) තුලින් පළාතේ/ප්‍රදේශයේ පවතින සාපේක්ෂ වාසි ලබා ගතයුතු වේ.

(iii) 2017 වසරට නියමිත සියළු ව්‍යාපෘති හා වැඩසටහන් නිම කිරීමට සෑම උත්සහයක්ම දැරීම තුලින් ශුන්‍ය පාදක අයවැය ප්‍රවේශයට අනුගත විය යුතුය.

(iv) කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කිරීමට පළාත් අධිකාරීන් බැඳී සිටී.

(v) අරමුදල් සීමිත බැවින්, වැඩසටහන්/ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීම තුලින් සම්පත් ප්‍රශස්ත ලෙස උපයෝජනය කිරීමටඉදිරිපත් කළයුතුය.

(vi) යම් හේතුවක් මත ව්‍යාපෘති කාලය වසරක් ඉක්මවන අවස්ථාවලදී ව්‍යාපෘතිය අදියරගත කිරීම තුලින් ඊළඟ වසරට අවශ්‍ය අරමුදල් ප්‍රමාණය වෙන්කර දැක්විය යුතුය.

(vii) යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති සඳහා පිරිවැය - ප්‍රතිලාභ විශ්ලේෂණ භාවිත කිරීම සහ පිරිවැය සාඵල්‍යතා ප්‍රවේශය මත සමාජීය යටිතල පහසුකම් සැපයීමේ ව්‍යාපෘති ඇගයීම සිදු කළ යුතුය.

(viii) ව්‍යාපෘති තීරණය කිරීමට පෙර ඒවායේ ශක්‍යතාවය, ගුණාත්මක බව, ප්‍රමිතීන් හා නඩත්තු කරලීම වැනි කරුණු පිළිබඳ නිසි සැලකිල්ලක් දැක්විය යුතුවේ.

(ix) රජයේ ගොඩනැගිලි ඉදිකිරීමේදී එම ප්‍රදේශයේ දේශගුණය හා භූමිය මත පදනම්ව සකසන ලද ආදර්ශ සැලැස්මක් අනුගමනය කළයුතු වේ.

(x) ගොඩනැගිලි හා අනෙකුත් ආකෘතීන් ඉදිකිරීමේදී අනවශ්‍ය ව්‍යුහයන් බැහැර කිරීම සහ ඉඩකඩ උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ අවධානය යොමු කළ යුතුවේ.

(xi) හැකි සෑම විටකම අදාල පාර්ශවයන්ගේ (පළාත් පාලන ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, ප්‍රජා මූලසංවිධාන) මූල්‍ය දායකත්වය ලබා ගැනීම තුලින් රාජ්‍ය අයවැය මත පීඩනය අවම කිරීම.

(xii) වාණිජ ශක්‍යතාවක් සහිත ව්‍යාපෘති සඳහා පෞද්ගලික අංශයේ සහභාගීත්වය ලබාගත යුතුය. ඒ සඳහා සුදුසු ආකෘති තෝරාගත යුතුවේ.

(xiii) වැඩසටහන්/ව්‍යාපෘති තෝරා ගැනීමේ දී පසුගාමී හෝ හුදෙකලා ප්‍රදේශ සඳහා ප්‍රමුඛතාව ලබා දිය යුතුය.

(xiv) ජාතික හා පළාත් අතර ද්විගුණනය හා ද්විකරණය වැළැක්වෙන අයුරින් ඉහත සියළු ක්‍රියාකාරකම් සංවිධානය විය යුතුය.

(xv) 2016/03/09 දින කැබිනට් මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණය අනුව ග්‍රාමීය ආර්ථික සංවර්ධනය සඳහා වෙන් කරන ලද අරමුදල් වලින් 25% ක් කාන්තාවන් සඳහා ප්‍රතිලාභ ලැබෙන ව්‍යාපෘති වල යෙදවිය යුතුය.

(xvi) නම්‍යශීලි ප්‍රතිපාදන යටතේ ලබාදී ඇති අරමුදල් සියළුම අංශ අතර සාධාරණ අයුරින් බෙදී යා යුතුය.

ඉහත උපදෙස් අනුගමනය කරමින් 2017 වසර සඳහා සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍ර 3 හා 3a, 2017 ජනවාරි 31ට පෙර එකඟතාවය ලබා ගැනීම සඳහා ලේකම්, මුදල් කොමිෂන් සභාව වෙත යොමු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මෙහි පිටපත් පළාත් අමාත්‍යාංශ ලේකම්වරු, දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් හා අනෙකුත් අදාළ පාර්ශව සමඟ හුවමාරු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

ඒ.ටී.එම්.යූ.ඩී.බී.තෙන්නකෝන්
ලේකම්
මුදල් කොමිෂන් සභාව

පිටපත්

| | |
|---|---|
| 1.ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය | -කා.දැ.ස. |
| 2.අග්‍රාමාත්‍ය ලේකම්, අග්‍රාමාත්‍ය කාර්යාලය | -කා.දැ.ස. |
| 3.ලේකම්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | -කා.දැ.ස. |
| 4.ලේකම්, මුදල් අමාත්‍යාංශය | -කා.දැ.ස. |
| 5.ලේකම්,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | -කා.දැ.ස. |
| 6.විගණකාධිපති,විගණකාධිපති දෙපාර්තමේන්තුව | -කා.දැ.ස. |
| 7.භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්, මහා භාණ්ඩාගාරය | -කා.දැ.ස. |
| 8.අධ්‍යක්ෂ ජනරාල්,ජාතික අයවැය දෙපාර්තමේන්තුව | -කා.දැ.ස. |
| 9.අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව | -කා.දැ.ස. |
| 10.නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) | -කා.දැ.ස. |
| 11. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) | -කා.දැ.ස. |
| 12.සහකාර විගණකාධිපති | -කා.දැ.ස. |